teachmore.lk

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

35 -I

මගේ අංකය / எனது இல. / My Ref. Ed/16/01/05/01 — ඔබේ අංකය / உமது இல. / Your Ref. — දිනය / திகதி / Date 2026.10.01

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම ප්‍රධානීන් (ප්‍රාථමික පන්ති පැවැත්වෙන රජයේ පාසල් හා රජයේ ආධාර ලබන/ නොලබන පෞද්ගලික පාසල්)

**2027 වර්ෂයේ පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීම.**

රජයේ පාසල්වල හා රජයේ ආධාර ලබන/ නොලබන පෞද්ගලික පාසල්වල 2027 වර්ෂයේ දී පළමුවන ශ්‍රේණියේ සිසුන් සඳහා විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීම 2027 ජනවාරි මස 20 වැනි දා (බදාදා දින) සිදු කිරීමට තීරණය කර ඇත. එදිනට පෙර පළමුවන ශ්‍රේණියට තෝරා ගත් සිසු දරුවන් පාසලට ඇතුළත් කිරීම සිදු කළ යුතු ය.

02. එදිනට එනම්, 2027.01.20 දින පළමුවන ශ්‍රේණියේ සිසුන්ට විධිමත් ලෙස පන්ති ආරම්භ කිරීමට අදාළ පිළිගැනීමේ වැඩසටහන පහත අංග ඇතුළත් ව සිදු කිරීම යෝග්‍ය වේ.

- 2027 වර්ෂයේ දෙවන ශ්‍රේණියේ සිසුන් විසින් නවක සිසුන් පිළිගැනීම.
- දෙමාපියන් හා ආරාධිත අමුත්තන් පිළිගැනීම, ජාතික හා පාසල් ධජ එසවීම, ජාතික ගීය හා පාසල් ගීය ගායනය.
- ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, පළමුවන ශ්‍රේණියේ නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථ හා අරමුණු පිළිබඳ ව පළමුවන ශ්‍රේණියට පිවිසෙන සිසුන්ගේ දෙමාපියන් දැනුවත් කිරීම.
- නවක සිසුන් පිළිගැනීම ප්‍රාථමික අංශයේ සිසුන්ගේ සහභාගීත්වයෙන් ප්‍රාසාංගික ලෙස සිදු කිරීම.

03. නවක සිසුන්ට පුමුඛ ස්ථානයක් ලැබෙන අයුරින් මෙම වැඩසටහන පැවැත්විය යුතු අතර සිසුන්ට හා දෙමාපියන්ට කිසිදු අපහසුතාවක් නොවන පරිදි වැඩසටහන සංවිධානය කිරීමට අවධානය යොමු කළ යුතුය.

04. මෙම වැඩසටහන සාර්ථක ව පැවැත්වීමට පාසලේ සියලු ම අංශ සහ පාසල් සංවර්ධන සමිතිය හා ආදී ශිෂ්‍ය සංගමය ඇතුලු සියලු ම පාර්ශවවල සහයෝගය හා සහභාගීත්වය ලබා ගැනීම සුදුසු ය.

05. එසේ ම පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන සිසුන් සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ සකස් කර ඇති **<u>දරුවන් හඳුනා ගැනීමේ</u>** වැඩසටහන (ප්‍රාථමික පාසලට ප්‍රීතිමත් ආරම්භයක්) 2027 ජනවාරි 05 දින සිට 2027 ජනවාරි 19 දින දක්වා (රජයේ නිවාඩු දින හැර) ජාතික අධ්‍යාපන ආයතනය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශවලට අනුකූල ව ක්‍රියාත්මක කළ යුතු ය.

06. දරුවන් හඳුනා ගැනීමේ වැඩසටහනට පසු ව පාසලට ඇතුළත් කර ගනු ලබන සිසුන් වෙනුවෙන් ද උක්ත අංක 05 ට අදාළ ක්‍රියාකාරකම් නම්‍යශීලී ලෙස සිදු කිරීමට පළමුවන ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන්ට උපදෙස් ලබා දිය යුතු ය.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය අතිශය අගය කරමි.

නාලක කලුවැව
ලේකම්

පිටපත්: 1. ගරු පළාත් ආණ්ඩුකාරතුමාගේ ලේකම්,............................................ - කරුණාවට
2. පළාත් ප්‍රධාන ලේකම්,............................................ - කරුණාවට

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister — +94112784832 — +94112784825 — minister.education@moe.gov.lk
ලේකම් / செயலாளர் / Secretary — +94112784811 — +94112785162 — secretary.education@moe.gov.lk — moesecretaryoffice@gmail.com

CamScanner